# සැඳෑව

சந்தாவ

ජ්‍යෙෂ්ඨයන්ගේ සොඳුරු අඬහැරය

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
2024 පෙබරවාරි - 2024 අප්‍රේල් කලාපය

අංක: DOP/NEWS/30/2024 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.


**සියලුම සාමාජික සාමාජිකාවන් වෙත,**

පසුගිය කාලය තුළ මහ බැංකු විශ්‍රාමිකයින් මුහුණ දුන් ගැටළු පිළිබඳව සහ **මහ බැංකු පාලන අධිකාරිය** සමඟ සහ **අනිකුත් වෘත්තීය සංගම්** සමඟ කළ සාකච්ඡා පිළිබඳ විස්තර සහ ඒ හා අදාළ ලිපි පිටපත් සියල්ල මෙම සැඳෑව කලාපයෙන් ඔබ වෙත ඉදිරිපත් කිරීම **අත්‍යාවශ්‍ය කටයුත්තක් වන හෙයින්** මෙම කලාපය එම නිල තොරතුරු වලට සහ වාර්තාවලට පමණක් සීමා කළ බව කරුණාවෙන් සලකන්න. සාමාජිකයින් විසින් එවන ලද මෙතෙක් ලැබී ඇති නිර්මාණ මීලඟ කලාපයට ඇතුළත් කරන අතර, තව තවත් ඔබගේ නිර්මාණ අප බලාපොරොත්තුවෙන් සිටින බවද විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

**අප සංගමය සඳහා නිර්මාණය කරන ලද නව නිල ලාංඡනය**

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

**පසුගිය මහා සභාව තුළින් නව වසර සඳහා පත්කරගන්නා ලද**

## නව නිලධාරී මණ්ඩලය

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | එස්.කේ.ජේ.යූ. ජයවර්ධන |
| **ගරු ලේකම්** | : | ඩී.පී. චන්ද්‍රසිරි |
| **ගරු භාණ්ඩාගාරික** | : | චන්ද්‍රකාන්ති එදිරිමාන්න |
| **ගරු උප සභාපති** | : | ආරියදාස තන්ත්‍රීගේ |
| **ගරු උප ලේකම්** | : | චන්ද්‍රදාස හෙට්ටිහේවා, ලීලා මොහන්සුන්දරම් |
| **ගරු උප භාණ්ඩාගාරික** | : | කේ.එම්. ජයසේන, ගීතමාලා ගුණසේකර |
| **ගරු සමාජයීය ලේකම්** | : | පද්මිණී විජේරත්න |
| **ගරු විධායක කමිටුව** | : | ශ්‍රදාණා රණතුංග, ජගත් කාරියවසම්, කේ.එස්. තිලකරත්න, ආර්.ඩී. අතුකෝරල |
| **ගරු සඟරා සංස්කාරක** | : | හේමසිරි ෆර්ඩිනැන්ඩු |
| **ගරු ගණන් පරීක්ෂක** | : | කේ. ජෙගනාදන් |

# 2023-2024 වාර්ෂික වාර්තාව

සාමාජික/සාමාජිකාවනි,

2023-2024 වාර්ෂික වාර්තාව මෙසේ සතුටින් ඔබට අත පත් කරමි. අප සංගමයේ සාමාජිකයින් ලෙස ඉතා සුහදව, එක්සත්ව තවත් කඩඉමක් පසු කිරීමේදී ලැබූ අත්දැකීම් අප අනුගමනය කරන ලද ක්‍රියා මාර්ගයන් ඇතුළු තොරතුරු පසුගිය සැඳෑව කලාප තුළින් මේ වනවිටත් ඔබව දැනුවත් කර ඇත.

අප 2023 වසර තුළ විධායක කමිටු රැස්වීම් 08 ක් සහ විශේෂ විධායක කමිටු රැස්වීමක්ද පැවැත්විය. 2024 වර්ෂය තුළ අප්‍රේල් මාසය දක්වා විධායක කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත. මේ කාලය තුළදී ප්‍රධාන ගැටළුවක්ව පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ අවමංගල්‍ය සහනාධාර අරමුදලේ මුදල් නැතිකමින් සහන ලබාදීම බොහෝ ප්‍රමාදයට පත්ව ඇති නිසා ඒවා ලබා ගැනීමට මියගිය සාමාජිකයින්ගේ පවුල්වල අයට දිගුකලක් පොරොත්තු ලේඛණයේ සිටීමට සිදුවීම ඉතාමත්ම කණගාටුදායක තත්ත්වයක් හෙයින් අප 2023-07-11 වන දින කාර්ය මණ්ඩල සේවා කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා සමග දීර්ඝ සාකච්ඡාවක් කළ අතර, මහ බැංකු විශ්‍රාමික්යින්ට යම් කටයුත්තකදී අවශ්‍යතාවය මත කාර්ය මණ්ඩල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ හා ලේකම් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් අංශයට පැමිණ තමන්ගේ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා මහ බැංකු පරිශ්‍රයට ඇතුල්වීමට අවසර ලබා නොදීමට පාලනාධිකාරිය ගෙන ඇති තීරණය පිළිබඳවද ඉතා පුළුල්ව කරුණු පෙන්වා දුන් අතර, එහිදී මරණාධාර අරමුදලේ ප්‍රශ්නයත් වෛද්‍ය ප්‍රතිලාභ බිල්පත්, රෝහල් ගතවීමේ බිල්පත් ආදිය ගෙවීමේ ප්‍රමාදය පිළිබඳවත් ඉතා දීර්ඝ ලෙස අප විසින් කරුණු දක්වන ලදි.

ශ්‍රී ලංකා මහ බැංකු අවමංගල්‍ය සහනාධාර අරමුදල පිළිබඳව කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත 2023-08-28 දාතමින් නැවතත් ලිපියක් යොමු කර්මින් එම අරමුදලේ ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා ඉදිරි වැඩ කටයුතු සඳහා කමිටුවක් පත්කර ගත් නමුත් එහි ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් පිළිබඳව විමසා සිටියෙමු.

පත් කරන ලද එකී කමිටුවට අප සංගමයෙන් ගරු සභාපති ආරියදාස තන්ත්‍රිගේ මහතාත්, ගරු උප සභාපති චන්ද්‍රදාස හෙට්ටිහේවා මහතාත්, විධායක කමිටුවේ සාමාජික ශ්‍රෝනා රණතුංග මහත්මියත් පත්ව සිටින අතර, එම කමිටුව මේ දක්වා රැස්වී ඇත්තේ වාර 02 ක් පමණි. 2023-10-02 වන දින එම අරමුදලේ මහ සභා රැස්වීමක් පවත්වා ව්‍යවස්ථාවේ ඇතැම් වගන්ති සංශෝධනය කරන බවටත් අලුත් සාමා්ජිකයින් බඳවා ගැනීමට කටයුතු කරන බව පැවසුවද අද වනතුරු කමිටු රැස්වීමක් කැඳවා නැත. මේ පිළිබඳවද අප සංගමය දිගින් දිගටම මෙම කමිටුව ක්‍රියාත්මක කරවා ගැනීමේ කටයුතු සඳහා මැදිහත් වෙමින් සිටින්නෙමු.

2024 තෙදින චාරිකාව සඳහා නුවරඑළිය ගමනාන්තය ලෙස යොදාගත් අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යාමේදී මෙවර අප බලාපොරොත්තු නොවූ ප්‍රශ්නයක් උද්ගත විය. මාර්තු මාසය තුළදී සංචාරය සැලසුම් කළද, සංචාරයට සහභාගී වන සාමාජිකයින් 90ක් පමණ දෙනාට නැවතීමේ පහසුකමක් සඳහා හෝටලයක්, නිවාඩු නිකේතනයක් සොයා ගැනීමේ ගැටළුවක් පැන නැගුණි. රටේ පැවති වාතාවරණය මත අප සාමාජිකයින්ට දැරිය හැකි මිලකට හොඳම පහසුකම් සහිත ස්ථානයක් සොයා ගැනීමටත්, විදේශ සංචාරකයින් බහුලව පැමිණෙන නිසා බොහෝ හෝටල් කලින්ම ඔවුන් සඳහා ජූනි මස දක්වාම වෙන්කරගෙන තිබීමත්, ආහාර පාන ඇතුළු පහසුකම් සඳහා ඉතා ඉහළ මිලක් ගෙවීමට සිදුවීමත් ආදී ප්‍රශ්නයන් මත තෙදින සංචාරය කල් දැමීමට සිදුවූ අතර, 2024-06-08 දින එක්දින සංචාරයක් සංවිධානය කිරීමට විධායක කමිටුව විසින් තීරණය කරන ලද අතර, එය මතුගම කුකුළේ ගඟ ලායා සංචාරක නිවාඩු නිකේතනයේදී පැවැත්වීමට තීරණය කරන ලදි.

3 පිටුවට...

2024 වැටුප් වැඩිකිරීම පිළිබඳව කටයුතු කිරීමේ දී අප සංගමය ද පවතින තත්ත්වයට සරිලන විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ අරමුණින් අධිපතිතුමා වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට ප්‍රථම මහ බැංකුවේ සියළුම වෘත්තීය සමිති සමඟ සාකච්ඡාවක් පවත්වා ඉතා සුහදව එක්ව කටයුතු කළ යුතු බවට විධායක කමිටුව තීරණය කළ අතර, ගරු උප සභාපති චන්ද්‍රදාස හෙට්ටිහේවා මහතාට එම සාකච්ඡාව සම්බන්ධීකරණය කිරීමටබ ලය පවරණ ලදී. ඒ අනුව එම කටයුතු සාර්ථක ලෙස ඉටු කරමින් 2024-01-17 වන දින එම හමුව මහ බැංකු සේවක සංගම් කාර්යාලයේ දී අප සංගමයේ මූලිකත්වයෙන් පැවැත්විනි. ඒ සඳහා මහ බැංකු ස්වෙච්ඡා විශ්‍රාමික සංගමයට ද අප ආරාධනා කළ අතර, ඔවුන්ගේ නියෝජනයද සිදුවිය. මේ සඳහා මහ බැංකුවේ සියළුම වෘත්තීය සංගම් සහභාගී වූ අතර, එම සාකච්ඡාව සඳහා අප සංගමය ගත් ප්‍රවේශය ඔවුහු හැමදෙනාම අගය කළහ. මෙහිදී මහ බැංකුවට යම්කිසි කටයුත්තක් සඳහා විශ්‍රාමිකයෙකු පැමිණි විට බැංකු පරිශ්‍රයට ඇතුළුවීමට ඉඩ ලබා නොදීම පිළිබඳව ද දීර්ඝ ලෙස සාකච්ඡා විය.

2024-01-17 වන දින මෙම සාකච්ඡාවෙන් අනතුරුව 2024 විශ්‍රාම වැටුප් සංශෝධන පිළිබඳව අප සංගමයේ ඉල්ලීම් හා යෝජනා සහිත එම ලිපිය අධිපතිතුමා වෙත යවනු ලැබීය. එම ලිපිය පසුගිය සැදෑව කළාපයෙන් ඔබ අතට පත්කර ඇත. අප සංගමයට එම කරුණු පිළිබඳව 2024-01-20 වන දින නියෝජ්‍ය අධිපති කේ.එම්.ඩී.එන්. දවුළුගල මහත්මිය හමුවී සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණි. ඒ සඳහා මහ බැංකුවේ සියළුම විශ්‍රාමික සංගම් වලට ආරාධනා කර තිබූ අතර, සාකච්ඡාව ඉතා සුහදව පුළුල් ලෙස කරුණු දැක්වූ සාකච්ඡාවක් විය.

එහිදී නියෝජ්‍ය අධිපතිතුමිය හැකි ඉක්මණින් මෙම සාකච්ඡාවේදී මතුවූ සියළු කරුණු පිළිබඳව අධිපතිතුමා වෙත නොපමාව දන්වන බවටත්, සාධාරණ විශ්‍රාම වැටුපක් වැඩිකල් නොගොස් ලබාදීමට කටයුතු කරන බවත් ඒ සඳහා ටික දිනක් ගතවන බවත් පැවසුවාය. මහ බැංකුව පත්කර ඇති අර්බුදකාරී තත්ත්වය හා විශ්‍රාමිකයින්ගේ වැටුප් පිළිබඳව සාකච්ඡා කිරීමට අධිපතිතුමාගෙන් කළ ඉල්ලීමට 2024-04-08 දින දුරකථනය ඔස්සේ 2024-04-09 දින පෙ.ව. 10.00 ට විධායක කමිටුවේ කිහිපදෙනෙකුට අධිපතිතුමා සමඟ සාකච්ඡාවකට පැමිණෙන ලෙස කළ දැනුම්දීම අනුව අපි 05 දෙනෙකු එදින අධිපතිතුමා හමු වූයෙමු. ඉතාම සුහදව සාකච්ඡාව පැවැත්වූ අතර, අධිපතිතුමා කියා සිටියේ රජයෙන් පත්කර ඇති කමිටුවේ වාර්තාව ලැබුණායින් පසු විශ්‍රාමිකයින් සඳහා සාධාරණ වැටුපක් ලබාදෙන බවය.

මේ අතරතුර මහ බැංකු වැටුප් සංශෝධන පිළිබඳව රට තුළ පැණනැගුන අර්බුද නිසා සියළු දේ ව්‍යාකුල තත්ත්වයට පත්ව ඇති බැවින්, අප සංගමය 2024-03-07 වන දින ශ්‍රී ලංකා මහ බැංකු විධායක නිලධාරීන්ගේ සංගමය සමඟ ද වැටුප් සංශෝධන අර්බුදයේ තත්ත්වය පිළිබඳ විශේෂ සාකච්ඡාවක් පැවැත්වීය. එයට මහ බැංකුවේ ස්වෙච්ඡා විශ්‍රාම සංගමය ද අප හා එක්වීය. එහිදී පවතින තත්ත්වය පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර, මෙම ප්‍රශ්නය ඉතා සුහදව විසඳ ගත යුතු බවටත් දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ කණ්ඩායම් මහ බැංකුවට එල්ල කරන අභූත චෝදනා බැහැර කිරීමටත්, අප හැමදෙනාම එකමුතුව එයට ශක්තිමත්ව මුහුණ දිය යුතු බවටත්, හැමදෙනාගේම මතය විය.

මෙම ප්‍රශ්නයේදී අප සංගමය හා සාකච්ඡාවට එක්වූ මහ බැංකු විධායක නිලධාරීන්ගේ සංගමයටද ස්වෙච්ඡා විශ්‍රාමික සංගමයට ද අපගේ ස්තූතිය පළ කරමු. තවද පසුගිය මාස කිහිපයකට එවකට ගරු සභාපති ආරියදාස තන්ත්‍රීගේ මහතා විදේශ ගතවූ බැවින් එම කාලය තුළ වැටුප් ප්‍රශ්නය අරමුදල් ව්‍යවස්ථා සංශෝධන ආදී විශේෂ කටයුතු අධීක්ෂණය කොට මෙහෙයවීමට ජයලාල් ජයවර්ධන මහතා අනුශාසකවරයෙකු ලෙස පත්කර ගන්නා ලදි. ස්වේච්ඡා විශ්‍රාමික ක්‍රමය යටතේ විශ්‍රාම ගිය සාමාජිකයින් කිහිප දෙනෙකුගේ විශ්‍රාම වැටුප් පිළිබඳව උද්ගතව තිබූ ගැටළු කිහිපයක් පිළිබඳවද ලේකම් දෙපාර්තමේන්තුවේ ලේකම්තුමිය සමඟ සාකච්ඡා කොට ඒ පිළිබඳ ලිපියක් 2023.09.18 වන දින අධ්‍යක්ෂ, මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යොමුකොට ඇත.

4 පිටුවට...

තවද සංගමයේ ව්‍යවස්ථාව විටින් විට විවිධ සංශෝධනයන්ට ලක්ව ඇති බැවින් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් සිංහල භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. සංගමයට විශේෂිත වූ ලෝගෝ එකක් නිර්මාණය කිරීමට තීරණය කරන ලද අතර අර්ථවත් ලෝගෝ එකක් අප කමිටු සභික හේමසිරි ෆර්ඩිනැන්ඩු මහතා විසින් නිර්මාණය කරන ලද අතර එම ලෝගෝ එක සහිත බැනර් කිහිපයක්ද ඒ සමඟම නිර්මාණය කරන ලදි. එමෙන්ම 2018 න් පසු විශ්‍රාම ගිය අප සාමාජික සාමාජිකාවන්ගේ ඡායාරූප සහ විස්තර ඇතුළත් අතිරේක අත්පොතක් සැකසීමටද තීරණය කළ අතර ඒ සඳහා අවශ්‍ය වර්ණ ඡායාරූපයක් සමඟ පුද්ගල තොරතුරු සංගමය වෙත එවන ලෙස සැඳෑව කලාප මඟින්ද, මුහුණු පොත හරහාද සාමාජිකයින්ගෙන් ඉල්ලීම් කළද සතුටුදායක ප්‍රතිචාරයක් නොලැබුනු බව සඳහන් කළ යුතුව ඇත.

ව්‍යවස්ථානුකූල ප්‍රශ්නයක් මත සතිස්ලාල් අල්විස් මහතා 2023.08.10 වන දින ඉල්ලා අස්වූ අතර, එම පුරප්පාඩුව සඳහා ජගත් කාරියවසම් මහතා ඒකමතිකව පත්කරගන්නා ලදි. අප සංගමයේ වැදගත් දැනුම්දීම් සහ විශේෂයෙන් සාමාජිකයෙකුගේ අභාවයක් සිදු වූ විට එය නොපමාව වට්ස්ඇප් මඟින් ද, මුහුණුපොත මඟින් ද, කෙටි පණිවිඩ මඟින් ද, සාමාජිකයින් දැනුවත් කිරීමේ මහඟු කාර්ය වඩාත් කැපවීමෙන් ඉටු කරන විධායක කමිටු සභික ජගත් කාරියවසම් මහතාට සංගමයේ විධායක කමිටුව වෙනුවෙන් විශේෂයෙන්ම ස්තූතිය පළ කරමි.

මහ බැංකුවට එල්ල වූ එල්.ටී.ටී.ඊ. බෝම්බ ප්‍රහාරයේ දී ජීවිත අහිමි වූ අප සහෘදයින් 41 දෙනා සිහි කිරීමටත්, එදින පීඩාවට පත් අනෙකුත් සියළුම දෙනාට ආශිර්වාද කිරීමත් උදෙසා 2024-01-31 දින මහ බැංකුවේ වීර සමාධිය අභියසදී පැවති අනුස්මරණ වැඩසටහනට අප විධායක කමිටුව සහභාගී වී මියගිය අය සිහි කරමින් පුෂ්පෝහාරය දක්වා සංගමයේ ගෞරවය හා ආචාරය පුද කරන ලදි.

සංගමයේ 2023 වාර්ෂික එක්දින සුහද හමුව සහ චාරිකාව වාද්දුව තල්පිටියේ ''ලායා'' හෝටලයේදී පැවැත්වුනි. ඒ සඳහා අප සොයුරු සොයුරියන් 90 දෙනෙකු පමණ සහභාගී වූ අතර, සංගීතය මැද ගී ගයමින් නටමින් සිත් සේ අතීතයේ සුවඳ විඳිමින් විනෝදයෙන් ගත කළ එම දිනය තවත් සුන්දර දිනයක් ලෙස හැම හදවත්වල රැඳී පවතිනු ඇත. දිනය අග වෙන්ව යන මොහොතේ සැමගේ විමසුම වූයේ තුන්දින චාරිකාව කවදාද යන්නයි.

අපගේ වාර්ෂික රැස්වීම සාර්ථක කර ගැනීමට අපට ''විදු පියස'' සහ දේශනාගාරය නොමිලේ ලබාදීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාටත්, අධ්‍යක්ෂ විදු පියස, සහ කාර්ය මණ්ඩලයටත්, අධ්‍යක්ෂ, ආරක්ෂක සේවා කාර්ය මණ්ඩලයටත්, විධායක කමිටුව වෙනුවෙන් අපගේ ස්තූතිය පිරිනමමු. එසේම මෙම කාලය තුළ මාහට සහයෝගය ලබාදුන් විධායක කමිටුවේ සියළුම දෙනාටත්, ගිණුම් පරීක්ෂක ලෙස කටයුතු කළ කේ. ජෙගනාදන් මහතාටත්, ගිණුම් කටයුතු නිවැරදිව සකසා ගැනීම සඳහා උපදෙස් දෙමින් සහයෝගය දැක්වූ සහෘද මිලන් ප්‍රනාන්දු මහතාටත්, අප සංගමයේ සියළුම සාමාජික සාමාජිකාවන්ටත් මගේ විශේෂ ස්තූතිය පළ කර අතරම, ඔබ මා කෙරෙහි තබන ලද විශ්වාසය පිළිබඳව මගේ හදබැඳි කෘතඥතා පූර්වක ගෞරවයද පුද කර සිටිමින් ඔබ සැමදෙනාටම සතුට හා නිරෝගීභාවය ලැබේවායි, ඉතසිතින්ම ප්‍රාර්ථනා කරමි.

ඩී.පී. චන්ද්‍රසිරි - ගරු ලේකම්

# 2023 - 2024 Annual report of the Central Bank Pensioners' Association.

Dear Members,

I take this as a great opportunity given to me to present the 2023-2024 annual report of CBPA. Already we have informed you the actions, we have taken in respect of the pension increase and other social activities through our news bulletin "Sandewa".

We held 08 Executive committee meetings in 2023 and 04 in 2024, totaling 12 meetings. The financial problems created by mismanagement of the Central Bank Death Relief Fund have made recipients to be in waiting list for a long period of time to get their legitimate claims after the death of spouse or father or mother. We have discussed this matter with the CBSL management on several occasions, and a committee was appointed. President Mr. Ariyadasa Thantrige, Vice President Mr. C. Hettihewa and committee member Mrs. Gnana Ranatunga were appointed to this committee from the CBPA. However, that committee was never summoned by the Staff Services Management Dept: We have taken up with the management, on several occasions with regard to "prohibiting pensioners enter the Bank premises". Still we have not received a decision.

Mr. Sathil lal Alwis resigned from the post of committee member of the EXCO with effect from 2023.07.25. according to the new rule passed by the AGM. Therefore, EXCO appointed Mr. Jagath Kariyawasam to the post of committee member. Mr. Jayalal Jayawardena was appointed to the post of Adviser by the EXCO with effect from 2023 .11.10. The EXCO of the view that Mr.Jayawardena's long experience as president would assist the CBPA in negotiating pension increase and other matters with the Management of the Bank.

Our annual get-together we had at the laya hotel Thalpitiya, Wadduwa on 2023.August 13. About 90 members participated and all of them enjoyed the occasion and showed their brotherhood by chatting dancing according to the music played by the band. Three-day trip which was planned to go to Nuwara Eliya had to be cancelled due to non-availability of rooms and very high prices due to tourist season. Instead of EXCO planned to have a one-day trip to Kukulegama Laya tourist resort on 2024 June 08. However, this has to be finalized by the new committee which will be elected on 2024 .04.20 at the AGM of the Association.

In respect of pension increase we have submitted our proposals to the management. We had discussions with the unions in the bank and other pensioners' associations of the Central Bank. Our proposals in respect of pension have been submitted to the management. These proposals we published in the last edition of "Sadewa". We had a discussion with Deputy Governor Mrs . K.M.D.N.Daulagala with regard to our proposals on 2024.01.20.. We were informed by the DG that she would inform the Governor. However, the Governor granted us an interview on 2024.04.09 to discuss certain issues. Any how the Governor informed us that as the president had appointed a committee to look in to this matter, therefore it would take some time to finalize the increase of pension. Anyhow with regard to the salary increased granted to present

6 පිටුවට...

employees became a big issue and parliamentarians started questioning the Governor and the Board members. Now a committee has been appointed by the president to look into this matter. Therefore, it will take some time to finalize the increase. We had taken-up with the management on 2023.09.06, some issues regarding those who retired under VRS.

The EXCO met on 2023.09.18. approved to have a new logo for letter headings and to make five new banners as the old banners are unusable. We requested members who retired after 2018 to submit their names, Bank ID no, phone no, and address with a photograph on several occasions to print an additional hand book, but the response were very poor. We have arranged to have a Sinhala version of the constitution of the association. We pay our condolences to families of the 29members who passed away.

We shall be thankful to Mr Jagath Kariyawasam for services rendered by him to inform important information and obituary notices in Facebook, WhatsApp and SMS. We Thank Mr. K. Jeganathan for his assistance given for the audit of books of the association and also we cannot forget Mr. Millaan Fernando for his support in preparation audit report, and a big thank you to Mr. Fenando On behalf of members I would like to thank Governor Dr. Nandalal Weerasigha all DGs, AGs and D/HR,Sectary,D/SSMD,D/Security and D/Vidu Piyasa and their staff for assisting us to carry out our responsibilities.

Finally, my thanks go to EXCO members for their support given to me, and We thank Mr. Jayalal Jayawardena for accepting our invitation to be an Adviser to the EXCO and representing matters to the Management of the CBSL. I would like to give my special thanks to the General membership for support given to me and committee.

Long life to our members.
DIRGAYU.

D.P. Chandrasiri.
Hon. Secretary.

## සාමාජිකත්වය වෙත...

- විශ්‍රාමිකයින්ගේ අත් පොතේ පලකිරීම සඳහා අදාළ තොරතුරු මෙතෙක් ඔබ ලබා නොදුන්නේ නම් නොපමාව පහත සඳහන් තොරතුරු ලේකම් වෙත සපයන්න. (නම, විශ්‍රාමික අංකය, ලිපිනය, දුරකථන අංකය, කුඩා උඩුකය ඡායාරූපයක්)

- සාමාජිකයින් වෙත යැවෙන ලිපි සමහරක් ලිපිනය වෙනස්වීම නිසා ආපසු ලැබෙන බව පෙනී යයි. එහෙයින් ඔබගේ ලිපිනය වෙනස් වී ඇති නම් ඒ බව නොපමාව ලේකම් වෙත දන්වන්න.

- හැකි සැමවිට සැඳෑව සඟරාවට ඔබගේ නිර්මාණ, විශේෂ ලිපි, ආදිය එවමින් ඒ සොඳුරු අතීතය හා සංවාදශීලී වන්න. (විශේෂ ලිපි හැකිතාක් සංක්ෂිප්ත කොට එවන්න)

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

නො.626/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.


2024-05-03

ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව,

මහත්මයාණෙනි,

**<u>වෛද්‍ය ප්‍රතිලාභ වැඩි කිරීම පිළිබඳවයි.</u>**

මේ වන විට මුළු විශ්‍රාමිකයින් 1650න් 900ක් පමණ වයස අවුරුදු 75 ඉක්මවූ වැඩිහිටි පිරිසකි. වැඩිහිටි වීමත් සමග ඇතිවන කායික හා මානසික දුබලතාවයන්ට අමතරව, වැඩිහිටියන් දියවැඩියාව, කොලොස්ටරෝල්, හෘද රෝග, අධි රුධිර පීඩනය, පිළිකා, ඩිමෙන්ෂියා වැනි රෝග එකකින් හෝ කිහිපයකින් පෙළෙන අය වේ. ඔවුන්ගේ කලත්‍රයන්ද එසේම රෝගී තත්ත්වයට මුහුණ දී ඇති වැඩිහිටි අය වේ. බොහෝ කලත්‍රයන්ට විශ්‍රාම වැටුපක් හිමි නොවන පෞද්ගලික අංශයේ රැකියාවන් කළ අය වන අතර, ඔවුන්ගේ මෙම වෛද්‍ය වියදම් දැරීම සිදුව ඇත්තේ මහ බැංකු විශ්‍රාම වැටුපෙන් වීම කෙරෙහි ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරවන්නෙමු.

රටේ පවතින වත්මන් තත්ත්වය අනුව ගුණාත්මක බෙහෙත්වල මිල අධික ලෙස ඉහළ යාමත්, ප්‍රවාහන වියදම් අධික වීමත්, ආහාර පාන වල මිල ඉහළ යාමත් නිසා විශ්‍රාමිකයන් මහත් අසීරුතාවයකට පත්ව ඇත. ඇතැමුන්ගේ විශ්‍රාම වැටුපෙන් අඩක්ම මෙම එදිනෙදා බෙහෙත් ගැනීම සඳහා වැය කිරීමට සිදුව ඇත.

| | | | |
|---|---|---|---|
| B 31 | – | බාහිර ප්‍රතිකාර සඳහා | (කොත්තමල්ලි) |
| B 33 | – | බාහිර ප්‍රතිකාර සඳහා | (කොත්තමල්ලි - වැන්දඹු අනත්දරු) |
| B 34 | – | බාහිර ප්‍රතිකාර සඳහා | (දියවැඩියා රෝගය) |
| B 35 | – | බාහිර ප්‍රතිකාර සඳහා | (ග්ලුකෝමා රෝගය) |
| B 36 | – | බාහිර ප්‍රතිකාර සඳහා | (හෘද රෝග) |

මේ සඳහා දැනට ගෙවනු ලබන මුදල් ප්‍රමාණයන් දෙගුණ කිරීමට කටයුතු කරන මෙන්, අප සංගමය ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නෙමු. එසේම මෙම ප්‍රතිලාභ ගෙවීම් (B 34, B 35, B 36) දැනට මහ බැංකු විශ්‍රාමිකයන්ට පමණක් ගෙවනු ලබන අතර, එම ගෙවීම් කලත්‍රයාට ද ලබා දීමට කටයුතු කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ඉහත සඳහන් කරුණු පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර නොපමාව ඒ සඳහා කටයුතු කරනු ඇතැයි, අපි බලාපොරොත්තු වෙමු.

ස්තූතියි.
මෙයට,

| | |
|---|---|
| ජයලාල් ජයවර්ධන | පී.ඩී. චන්ද්‍රසිරි |
| සභාපති | ලේකම් |

පිටපත : අධ්‍යක්ෂ, කාර්යමණ්ඩල සේවා කළමණාකරන දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

නො.626/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.

2024-05-07
ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව,

මහත්මයාණෙනි,

**<u>අප සංගමයේ 2024-04-20 වන දින රාජගිරියේ විදුපියසේදී පැවැත්වූ වාර්ෂික මහ සභා රැස්වීමේදී සම්මත කරන ලද පහත සඳහන් යෝජනා ඔබතුමා වෙත ඉදිරිපත් කරමි.</u>**

1. 1992-01-20 වන දින අප සංගමය වෙනුවෙන් සීමා සහිත හැටන් නැෂනල් බැංකුවේ ගිණුම විවෘත කිරීමේදී අප සංගමයේ නම ''ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සුබසාධක සංගමය'' ලෙස දක්වා ඇත. එය ''ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය'' ලෙසම විය යුතු අතර, ඒ අනුව අදාළ බැංකු ගිණුම සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙස යෝජනා කරමු.

2. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ විශ්‍රාමිකයින්ට පමණක් බාහිර ප්‍රතිකාර සඳහා ප්‍රතිපූර්ණය කරනු ලබන,
B 34 – බාහිර ප්‍රතිකාර සඳහා – දියවැඩියා රෝගය
B 35 – බාහිර ප්‍රතිකාර සඳහා – ග්ලුකෝමා රෝගය
B 36 – බාහිර ප්‍රතිකාර සඳහා – හෘද රෝග වන ප්‍රතිලාභයන් මහ බැංකු විශ්‍රාමිකයින්ගේ කලත්‍රයාට ද ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීමට යෝජනා කරමු.

3. අප විශ්‍රාමිකයින්ට තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා මහ බැංකු පරිශ්‍රය තුළ කාර්ය මණ්ඩල කළමනාකරණ දෙපාර්තමේන්තුවට හා ලේකම් දෙපාර්තමේන්තුවට ඇතුළුවීමට අවසර ලබාදෙන ලෙස පාලනාධිකාරියෙන් ඉල්ලා සිටීමට යෝජනා කරමු.

4. 2002-02-01 දින (VRS) ස්වෙච්ඡා විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම ගිය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී සිදුවී ඇති විෂමතාවය කොටසකට පමණක් නිවැරදි කර ඇත. සෙසු විශ්‍රාමිකයින්ගේ ද එම විෂමතාවය ඉවත් කර ඉක්මණින් එම ප්‍රශ්නය විසඳීමට කටයුතු කරන ලෙස පාලනාධිකාරියෙන් ඉල්ලා සිටීමට යෝජනා කරමු.

5. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ CAT CDE සඳහා හිමිකම් පෑමේ අවස්ථාව මෙතෙක් මගහැරී ගොස් සිටින විශ්‍රාමිකයින් හට මේ වන විට ඒ සඳහා ගෙවිය යුතු මුළු දායක මුදල සහ ඊට අදාළ වන පොලිය අයකර ගැනීමෙන් අනතුරුව එම හිමිකම් පෑමට අවස්ථාව ලබාදෙන ලෙස යෝජනා කරමු.

6. ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කර වසර 75කට අවතීර්ණ වෙමින් පවතින අවධියකදී ඉතිහාසයේ සිදු නොවූ විරූ ඛේදනීය තත්ත්වයකට මහ බැංකුව ඇද දමමින් සිදුකළ පාවාදීම සඳහා සහාය දැක්වූ මහ බැංකු සෙවනේ ලැගුම් ගෙන සිටින විවිධ දේශපාලන න්‍යාය පත්‍රයන්ට ගොනු වූ බලවේගයන් විවිධ වරදාන, වරප්‍රසාද වලට යටවී වැටුප් වැඩිකිරීමේ ක්‍රියාවලියේ දී මහ බැංකුවට විරුද්ධව රහස්‍ය තොරතුරු පිටතට ලබා දී කරන ලද මාධ්‍ය සංදර්ශනයන් තුළින් මහ බැංකුවට එල්ල කරන ලද විවිධ අවලාද අපහාසයන් පිළිබඳවත්, ජනතාව තුළ මහ බැංකුව හා සේවකයින් පිළිබඳ ඇති කළ විරෝධතාවය හා වෛරය පිළිබඳවත් අපගේ දැඩි අප්‍රසාදය පළ කරන අතරම, මෙම කටයුතු සිදු කළ අය පිළිබඳව නොපමාව විධිමත් පරීක්ෂණයක් පවත්වා තරාතිරම නොබලා ඔවුන්ට උපරිම දඬුවම් ලබාදීමට ක්‍රියා කරන ලෙස මෙම මහා සභාව යෝජනා කරන්නීය.

සම්මත කරන ලද මෙම යෝජනා පිළිබඳ ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

ස්තූතියි.
මෙයට, පී.ඩී. චන්ද්‍රසිරි - ලේකම්

2024-05-15

ලේකම්
ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
නො. 626/14, ගෝවින්න පාර,
සාම පෙදෙස,
අතුරුගිරිය.

මහත්මයාණෙනි,

1. ''වෛද්‍ය ප්‍රතිලාභ වැඩිකිරීම පිළිබඳවයි'' 2024.05.03 දිනැති ලිපිය
2. ''2024.04.20 වන දින පැවැති අප සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කර ගන්නා ලද යෝජනා පිළිබඳවයි'' 2024.05.07 දිනැති ලිපිය

ඔබ විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තුමා වෙත හා අපටද පිටපතක් සහිතව එවන ලද ඉහත සඳහන් ලිපි අප දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බව මෙමගින් තහවුරු කරමු.

විශ්‍රාමිකයන්ට තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඇතුළුවීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටින යෝජනාව පිළිබඳව ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු. මෙම කරුණ සම්බන්ධව මීට පෙර ඔබ සංගමයේ නිලධාරීන් සමග පැවති රැස්වීම්වලදී පැහැදිලි දැනුවත් කිරීමක් කර ඇති අතර, යම් විශ්‍රාමිකයෙකුට කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් යම් කාර්යයක් ඉටුකර ගැනීම සඳහා ඇතුළුවීමට අවශ්‍ය වන්නේ නම් සතියේ වැඩ කරන දිවලදී රාජකාරී වේලාවන් තුළ (පෙ.ව. 8.00 සිට ප.ව. 4.15 දක්වා) කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමාගේ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාගේ හෝ වෙනත් බලයලත් නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය ලබාගෙන සිය අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැමිණිය හැකි බව දන්වා සිටිමු.

තවද, අප දෙපාර්තමේන්තුට අදාළ ඔබගේ අනෙකුත් යෝජනාවන් සම්බන්ධයෙන් ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම් දීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමු.

මෙයට,

අධ්‍යක්ෂ
කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

නො.626/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.


2024.07.10

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති,
නෙළුම්ණි දවුලුගල මහත්මිය,
ශ්‍රී ලංකා මහ බැංකුව,
ජනාධිපති මාවත,
කොළඹ 01.

මහත්මියෙනි,

**2024.07.08 වන දින අප සංගමයේ සභාපති තුමන් හා ඔබ තුමිය අතර පැවැති දුරකථන සංවාදයට අමතරව යි.**

මෙම සංවාදයට අනුව 2024 ජනවාරි මස සිට සිදුකල යුතු විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාල වැඩකටයුතු මේ වන විටත් අවසන්ව නොමැති බව හෙලි වී ඇත.

ආහාර මිල, බෙහෙත් වර්ගවල මිල ඉහල යාම නිසා විශ්‍රාමිකයින් මේ වන විට මහත් අපහසුතාවයට පත්ව ඇත. මේ කටයුත්ත තවදුරටත් ප්‍රමාද වුවහොත් ජනවාරි මස සිට මේ වන තෙක් හිඟ මුදල් ගෙවීමේදී පෙර පරිදි නොව, විශාල මුදලක් බදු වෙනුවෙන් ද ගෙවීමට සිදු වේ. මේ කරුණ කෙරෙහි අවධානය යොමු කරමින්, තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීමට හැකි ඉක්මනින් අප සංගමය වෙත සාකච්ඡාවක් ලබා දීමට කටයුතු සලසා දෙනමෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි.
මෙයට,

පී.ඩී. චන්ද්‍රසිරි
ලේකම්

පිටපත :- අධිපතිතුමා ශ්‍රී ලංකා මහ බැංකව

---

**විශ්‍රාම වැටුප් ප්‍රශ්නය පිළිබඳව මහ බැංකු අධිකාරිය වෙත ජයලාල් ජයවර්ධන මහතා විසින් යොමුකරන ලද වට්ස්ඇප් පණිවිඩ...**

Dear Sir, I understand that the pensioners increase is not taken up as yet. Sir our members are find it difficult with present increases in food items, medicines etc. We submitted our proposals earlier. I requested to take up pension increase together with present employees salary increase. Already delayed by 8 months, therefore, members will have to pay higher taxes because they receive a lump sum as arrears. Please advise DG to take up pension increase earlier.

Thank you.
Jayalal Jayawardena President, CBPA

**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය**

නො.626/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.

පාලක මණ්ඩලය,
පාලක මණ්ඩල ලේකම් කාර්යාලය,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

2024.07.29

**<u>2024 විශ්‍රාම වැටුප් සංශෝධනය</u>**

මහත්මයාණෙනි,

සෑම වසර තුනකටම වරක් මහ බැංකු සේවකයන්ගේ වැටුප් සංශෝධනය කෙරෙන අතර එයට සමගාමීව මහ බැංකු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ද සංශෝධනය කිරීම සම්ප්‍රදායානුකූලව සිදු කෙරේ. 2024 විශ්‍රාම වැටුප් සංශෝධනය පිළිබඳ අප සංගමයේ යෝජනාව 2024.01.17 වන දින මහ බැංකු අධිපතිතුමන් වෙත භාර දී ඇත.

මේ වන වි ටමහ බැංකු සේවකයන්ගේ වැටුප් සංශෝධනය ක්‍රියාත්මක වන අතර විශ්‍රාම වැටුප මෙතෙක් සංශෝධන කෙරී නොමැත. බෙහෙත් මිල හා ආහාර පානවල මිල ඉහළ යාම නිසා අප විශ්‍රාමික පිරිස මහත් අසීරුතාවයට පත්ව තිබීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමු.

2024 ජනවාරි සිට හිඟ මුදල් ගෙවීමක් සිදුවිය යුතු වුවද, තවත් මේ කරුණ මන්දගාමී වීමෙන් හිඟ මුදලින් විශාල ප්‍රමාණයක් බදු ලෙස ගෙවීමට සිදු වීමෙන් විශ්‍රාමිකයන්ට විශාල පාඩුවක් සිදුවන බව සඳහන් කළ යුතුව ඇත.

රජයේ සේවකයන්ට හා රජයේ විශ්‍රාමිකයන්ට අදාළ වැටුප් වැඩිවීම් කිහිප විටකදීම මේ වන විට ලබා දී ඇත. කරුණු මෙසේ හෙයින් මේ පිළබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර විශ්‍රාම වැටුප් සංශෝධනය කඩිනම් කිරීමට කටයුතු සළසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි.

මෙයට,

ජයලාල් ජයවර්ධන
සභාපති

පී.ඩී. චන්ද්‍රසිරි
ලේකම්

**<u>විශ්‍රාම වැටුප් ප්‍රශ්නය පිළිබඳව මහ බැංකු අධිකාරීය වෙත ජයලාල් ජයවර්ධන මහතා විසින් යොමුකරන ලද වට්ස්ඇප් පණිවිඩ...</u>**

Dear Sir, I understand that the committee report on Central Bank has been now submitted. Please instruct DG to take up pension increase together with present employees salary increase. I request this because after declaration of elections monitory gains cannot be grantd thanks.

Theruwan Saranai.
Jayalal Jayawardena, President CBPA.

# මහ බැංකු අධිපතිතුමන් සහ අදාළ නිලධාරී මහතුන් සමඟ 2024.08.06 දින පවත්වන ලද සාකච්ඡාව

2024 විශ්‍රාම වැටුප් සංශෝධනය - අධිපති තුමාද විශ්‍රාමිකයෙකු හෙයින් එතුමා මෙම සාකච්ඡාවට සහභාගී නොවූ අතර, නියෝජ්‍ය අධිපතිනි නෙළුම්ණි දවුළුගල මහත්මිය සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කරන ලෙස එතුමා අප වෙත උපදෙස් දෙන ලදි. ඒ සඳහා ඉක්මනින් දිනයක් ලබාදෙන බව නියෝජ්‍ය අධිපතිතුමිය පවසා සිටියාය.

සෙසු කරුණු පිළිබඳව සාකච්ඡාවට අධිපතිතුමා සහභාගී විය. එහිදී අප සංගමයට වසර 50 ක් පිරීම නිමිත්තෙන් පැවැත්වීමට සැලසුම් කර ඇති විශේෂ උත්සවය පිළිබඳ කරුණු පැහැදිලි කරන ලද අතර, එම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අධිපතිතුමාට ආරාධනා කිරීමටත්, සෙසු සියළුම පෙර අධිපතිවරුන්ට සහ නියෝජ්‍ය අධිපතිවරුන්ට ආරාධනා කිරීමටත් එම උත්සවය 2025 පෙබරවාරි මස රාජගිරිය විදු පියසේදී පැවැත්වීමටත් සංගමය ගෙන ඇති තීරණය අප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

වෛද්‍ය ප්‍රතිලාභ යටතේ B-34 දියවැඩියා රෝගය, B-35 ග්ලූකෝමා රෝගය, B-36 හෘද රෝග ආදී රෝග සඳහා විශ්‍රාමිකින්ට පමණක් ප්‍රතිපූරණය කරනු ලබන වෛද්‍යාධාර පහසුකම් විශ්‍රාමිකයින්ගේ කාලත්‍රයාටද ලබාදෙන ලෙස ඉල්ලූ අතර ඒ පිළිබඳව තීරණයක් නොලැබුණි.

2022.02.01 ස්වේච්ඡා (VRS) විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම ගිය සේවකයින් 6 දෙනෙකුගේ සේවා කාලය ගණනය කිරීමේදී ඇතිවී ඇති අඩුපාඩුව පිළිබඳව සාධාරණයක් කරන ලෙස මීට පෙර පාලන අධිකාරිය වෙත අප විසින් ඉදිරිපත් කරන ලද ලිපිය කෙරෙහි අවධානය යොමු කරවූ අතර ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස අධිපතිතුමන් විසින් මානව සම්පත් අධ්‍යක්ෂතුමා වෙත දැන්වීය.

වෛද්‍යාධාර ප්‍රතිලාභ ක්‍රමය යටතේ CAT-CDE සඳහා හිමිකම් පෑමේ අවස්ථාව මගහැරීගොස් සිටින විශ්‍රාමිකයින් හට මේ වනවිට ඒ සඳහා ගෙවිය යුතු මුළු දායක මුදල සහ ඊට අදාළ වන පොළිය අයකර ගැනීමෙන් අනතුරුව එම හිමිකම් පෑමට අවස්ථාව ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම ද ඉටු කළ නොහැකි බව කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ අධ්‍යක්ෂවරයා පැවසීය.

මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් තුවාල ලැබූ ඩබ්. අනුර ශාන්ත මහතාගේ පාදයේ ශල්‍ය කර්මය සඳහා වැයවූ මුදල පිළිබඳව, වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ කොටසක් පමණක් ප්‍රතිපූර්ණය කර, කොටසක් නොගෙවීම සම්බන්ධයෙන් ඔහු විසින් කරන ලද ඉල්ලීම පිළිබඳව අප වෙතද ඔහු ඉදිරිපත් කළ ලිපිය අනුව අප විසින් කරුණු විමසූ අතර එහිදී, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ අධ්‍යක්ෂතුමා පවසා සිටියේ ඔහුට හිමි ප්‍රතිලාභ කෝටාව ගෙවා ඇති බවද, වෙනත් ගෙවීමට ප්‍රතිපාදනයක් නොමැති බවය. කෙසේ වෙතත් ඔහු පෞද්ගලික බැංකුවකින් ණය මුදලක් ලබාගෙන ඉතිරි මුදල ගෙවා ඇති බවද, එමගින් ඔහුට සිදුවී ඇති අසීරුතාවය පිළිබඳව මානුෂිකව සලකා බලා හැකියාවක් ඇතොත් එය ඉටුකර දෙන ලෙස සභාපතිතුමා විසින් විශේෂ ඉල්ලීමක් කරන ලදි.

මහ බැංකු අවමංගල්‍ය සහනාධාර අරමුදලේ මුදල් නොමැතිවීම නිසා පොරොත්තු ලේඛනයේ 60 දෙනෙකු පමණ සිටින බැවින් එම ගෙවීම් සඳහා මහ බැංකුවෙන් යම් මුදලක් යොදවා එම පොරොත්තු ලේඛනයේ සිටින අයට හිමි මුදල් ගෙවීමට කටයුතු යොදන ලෙස ඉල්ලා සිටින ලදි. නමුත් අදාළ අරමුදලේ මුදල් යොදවා ඇති ෆිනෑන්ස් සමාගම සම්බන්ධයෙන් පවතින නඩු කටයුත්ත හමාර වනතුරු අප සංගමයේ අරමුදලට බැංකුවෙන් මුදල් ලබාදිය නොහැකි බවත් නිලධාරී මහතුන් විසින් පෙන්වා දෙන ලදි.

ඖෂධ මිල ඉතා අධික ලෙස වැඩිවී ඇති හෙයින් අදාළ වෛද්‍යාධාර දෙගුණයකින් වැඩිකර දෙන ලෙසද විශේෂ ඉල්ලීමක් කරන ලදි.

# 2024 විශ්‍රාම වැටුප් සංශෝධනය පාලන අධිකාරිය සමඟ පැවති සාකච්ඡාව

**2024 අගෝස්තු මස 15 වන දින** නියෝජ්‍ය අධිපතිනි නෙළුම්නි දවුළුගල මහත්මිය, මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ප්‍රභාත් මහතා ඇතුළු නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සමඟ පැවැති සාකච්ඡාවට අප සංගමය වෙනුවෙන් සභාපති ජයලාල් ජයවර්ධන, ලේකම් ඩී.පී. චන්ද්‍රසිරි, උපසභාපති ආරියදාස තන්ත්‍රිගේ, විධායක කමිටු සභික ඥානා රණතුංග යන මහත්ම මහත්මීන් සහභාගී විය.

අපේ සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ වූයේ මෙතෙක් අවසන් වී නොමැති 2024 විශ්‍රාම වැටුප් සංශෝධනයේ වත්මන් තත්ත්වය පිළිබඳ විමසීමයි. සභාපති ජයලාල් ජයවර්ධන මහතා සාකච්ඡාව ආරම්භ කරමින් මහ බැංකු පාලන සේවකයන්ගේ වැටුප් සංශෝධනය කරන අවස්ථාවේදීම විශ්‍රාමිකයන්ගේ වැටුප් සංශෝධනය කරන මෙන් කිහිපවතාවක්ම අප විසින් සිටියද, එහෙත් ඒ පිළිබඳව කිසිදු සැළකිල්ලක් මෙතෙක් නොදක්වා ඇති බව අපට පෙනෙන බව පවසන ලදී. 2024 පෙබරවාරි මාසයේදී වැටුප් වැඩිවීම සංශෝධනය කළ වහාම වැඩි වූ වැටුප ඉතාමත් ඉක්මණින්ම සේවකයන්ට ගෙවීමට කටයුතු කළේ හිඟ වැටුප් ගෙවීමට සිදුවුවහොත් ඔවුන්ට ගෙවීමට සිදුවන බදු ප්‍රමාණය අධික වන බැවිනි. එසේනම් දැන් විශ්‍රාමිකයන්ට සිදුවන්නේ මාස 12ක් පමණ හිඟ වැටුප් ලැබුණු විට ඉන් භාගයක් පමණ බදු වශයෙන් ගෙවීමට ය. මෙය ඉතාමත් අසාධාරණ බව සභාපති තුමා පැහැදිලි කළේය. අදටත් කිසිම අන්දමක යෝජනාවක් මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් කර නැත. මෙහි අධ්‍යක්ෂකතුමා කරුණු පැහැදිලි කරමින් විශ්‍රාම වැටුප් යෝජනාව කමිටුවට ඉදිරිපත් කිරීමට මාසයක් පමණ ගතවන බව පැවසීය. මෙවර අප සොච්චම් වැඩිවීමක් බලාපොරොත්තු නොවේ. පාර්ලිමේන්තුවෙන් පත්කළ මහ බැංකු වැටුප් සංශෝධන කමිටු වාර්තාව අනුව තවත් වසර 05කට වත් වැටුප් සංශෝධන ලබා දිය නොහැක. එමනිසා මෙවර විශ්‍රාමිකයන්ටත් 70% වැටුප් වැඩිවීමක් ලබා දෙන මෙන් සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

තවද 2006ට විශ්‍රාම වැටුප් 2015 දී එදා සිටි අධිපති අර්ජුන මහේන්ද්‍රන් මයා යාවත්කාලීන නොකළේ නම් 2010ට පෙර විශ්‍රාම ගිය සේවකයන්ට ලැබෙන්නේ ඉතාමත් අඩු විශ්‍රාම වැටුපකි. මාසයක් තියා සති 02ක් වත් ජීවත්වීමට එයින් නොහැකිය. අදටත් වත්මන් තත්ත්වය එසේමය. ප්‍රතිශතාත්මක වැඩිවීම මඟින් අපේ වැටුප් ප්‍රශ්නයට නිසි පිළිතුරක් නොලැබේ. එහෙයින් 2018 ට විශ්‍රාම වැටුප යාවත්කාලීන කළ යුතුව ඇත. එහෙත් වත්මන් අධිපතිතුමා යාවත්කාලීන කිරීමට කිසිඳු එකඟතාවයක් පළ කර නොමැත. එමනිසා විශ්‍රාමිකයින්ට 70%ක වැඩිවීමක් ලබා දෙන මෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටින බව සභාපති ජයලාල් ජයවර්ධන මහතා ප්‍රකාශ කළෙමු. එසේම විශ්‍රාම වැටුප් ප්‍රශ්නය විසඳීම මෙතරම් පමාවීම පිළිපඳව අපගේ කණගාටුව ප්‍රකාශ කළේය. ඥානා රණතුංග මිය කරුණු පැහැදිලි කරමින් අපේ විශ්‍රාමික පිරිසෙන් 40 දෙනෙකු පමණ වයස අවු. 90 ඉක්ම වූ අය බව ද, අවු. 80ට වැඩි 800ක් පමණ වන බව ද, පැවසූ අතර ඔවුන් සෑම වැඩිහිටි බවට පත්වන විට ඇතිවන ස්වභාවික සංකූලතාවලට අමතරව දියවැඩියා, හෘද රෝග, අධි රුධිර පීඩනය වැනි බෝ නොවන රෝග වලින් ද, වර්තමානයේ පාර්කින්සන් හා ඩිමෙන්ෂියා වැනි රෝග වලින් ද පෙළෙන අතර ලැබෙන විශ්‍රාම වැටුපෙන් භාගයක්ම බෙහෙත් සඳහා වියදම් වන අතර තම කටයුතු වලට උපකාර ලබා ගැනීම සඳහා සහයකයින් ද ලබා ගැනීමට ඇතැමුන්ට සිදුව ඇති බව ද පැහැදිලි කළාය. මේ වන විට 2006 ට විශ්‍රාම වැටුප් යාවත්කාලීන කර ඇතත් දැන් විශ්‍රාම ගන්නා අය හා පැරණි විශ්‍රාමිකයන් අතර විශ්‍රාම වැටුපෙහි පස් හය ගුණයක පරතරයක් පවතින බවත් කීවාය. 2011 වසර අගදී විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිවරයෙකු මේ වන විට ලබා ගන්නේ රුපියල් ලක්ෂ 03 කට අඩු මූලික විශ්‍රාම වැටුපක් බවත්, වත්මන් වැටුප් අනුව විශ්‍රාම යන නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ මූලික විශ්‍රාම වැටුප ලක්ෂ 15 ක් වන බවත්,

14 පිටුවට...

මෙම පරතරය අඩු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාම වැටුප් සංශෝධනය සිදුකරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

අප සංගමය සුළු සේවක මහතාගේ සිට අධිපතිතුමන් දක්වා සාමාජිකත්වය දරණ 1200ක පමණ සාමාජිකයන් සිටින සංගමයක් බවත් මේ අදහස් ඉදිරිපත් කරන්නේ ඒ සියළු දෙනාම නියෝජනය කරමින් බවත් පැවසීය. මෙම පරතරය නිවැරදි ලෙස අඩුකිරීමට නම් යාවත්කාලීන කිරීමක් සිදු කිරීම වඩා උචිත බව අපගේ හැඟීම බව පැවසූ ජයලාල් ජයවර්ධන මහතා මෙම පරතරය රාජ්‍ය විශ්‍රාමිකයන් අතර ද පවතින නිසා එය අඩුකිරීමට මේ වන විට රජය දෙවරක් යාවත්කාලීන කිරීම් සිදුකර ඇති අතර, අපගේ ඉල්ලීම ද වැටුප් යාවත්කාලීන කිරීම වන අතර, අධිපතිතුමන් එයට මනාපය පළ නොකිරීම කණගාටුවට කරුණක් බවද පැවසීය.

1991 වසරේදී පැරණි විශ්‍රාමිකයන්ට 50% ක වැඩිවීමක් දී ඇති බවත් මේ අවස්ථාවේදී හොඳ විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටි ශ්‍රදානා රණතුංග මහත්මිය දැනට වසරකට විශ්‍රාමිකයින් 50-60 ක් මිය යන බවත්, එවිට වැඩි කරනු ලබන මුදල් ප්‍රමාණය පමණක් නොව දැනට වැඩි කරනු ලබන මුදල් ප්‍රමාණය පමණක් නොව දැනට ලබා ගන්නා මූලික විශ්‍රාම වැටුප, ජීවන වියදම් දීමනාව ද, වෛද්‍ය මුදල් ප්‍රතිපූරණය ද, නතර වන නිසා වැඩි කිරීම් උදෙසා යන මුදල අධිකයයි නොසිතන ලෙසත් ප්‍රකාශ කළාය. නව විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාම අප කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙසත්, ලබා ගන්නා කුඩාම මූලික විශ්‍රාම වැටුප සළකා බලා ප්‍රතිශත තීරණය කරන ලෙසත් ඉල්ලා සිටියා ය. 1.5% ප්‍රතිශතයෙන් ආදේශ නොකරන ලෙසත් ඉල්ලා සිටි අතර එම ප්‍රතිශත අනුව සමහර අයට රු. 750/- පමණ වැඩිවීමක් සිදු වී තිබුණ බවත්, එය වැඩ කරන අයගේ වැටුප් වර්ධකයකටත් වඩා කොතරම් අඩුද? යන්න කෙරෙහි අවධානය යොමු කළාය.

අප විශ්‍රාම ක්‍රමයෙන් ඉදිරියට විශ්‍රාම යන පිරිස 200 ටත් වඩා අඩුය. 2034 වන විට අන්තිම විශ්‍රාමිකයා විශ්‍රාම යනු ඇත. එවිට අපේ විශ්‍රාම වැටුප් අරමුදලට මුදල් එකතුවීම නවතින නිසා, නව විශ්‍රාම වැටුප් ක්‍රමය එයට එකතු කර එකම විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලෙස සකස් කරන ලෙසද ඉල්ලා සිටියාය. නව විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් විශ්‍රාම යන පිරිස වසරකට 10-15 වීමට තව වසර 15-20 ක් යන අතර එවිට අප විශ්‍රාම වැටුප් ක්‍රමයේ පිරිස භාගයකට අඩු වී සිටිනු ඇති බවද අවධාරණය කළාය.

දැනට විශාම වැටුප් සංශෝධන යෝජනාව සකස් කරගෙන යන බවත් බවත්, (*remuneration committee*) වැටුප් කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මාණ්ඩලික පත්‍රිකා (*board paper*) සකස් කර පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු බව නියෝජ්‍ය අධිපතිනිය පැහැදිලි කළාය. මින් පසුව සියළුම දීමනා සම්බන්ධව ඉල්ලීම් අදාළ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවට පාර්ලිමේන්තු කෝප් කමිටුවෙන් උපදෙස් ලබා දී ඇති බව ද පැවසීය. තව සති කිහිපයකින් පමණ ඔවුන් අදාළ යෝජනාව එම කමිටුවට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී. එතෙක් අප වෙත අන්තර් දීමනාවක් දෙන ලෙස ඉල්ලීම් කළ ද එයට ප්‍රතිචාරයක් නොවීය. තවද ඔබතුමන්ලාට හොඳ වැටුප් වැඩිවීමක් ලැබී තිබෙන නිසා තව වසර 05 ක් බලා සිටිය හැකි වන සේ හොඳ විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා ය.

## 2023 වසරේ අප අතරින් සදහටම වියෝවූ සොයුරු සොයුරියන්...

414 -D.R. රත්නසේකර මහතා
1189 - S. සුගතදාස මහත්මිය
946 - ලිනට් ද සිල්වා මහත්මිය
210 - H.B. ඉමානිස් මහතා
645 - M.E.G.R. ප්‍රනාන්දු මහතා
286 - ගාමිනී අතපත්තු මහතා
3057 - S. සෝමරත්න මහතා
3007 - ආනන්ද වීරසිංහ මහතා
1176 - H.M. ප්‍රේමසිරි මහත්මිය
784 - නිහාල් සිරිවර්ධන මහතා
793 - B.T. ජයතිලක මහතා
618 - A.G.K. පෙරේරා මහතා
202 - P.W. උපසේන මහතා
632 - රෝහිණී ප්‍රනාන්දු මහත්මිය
511 - G. පලිහක්කාර මහත්මිය
766 - W.R. සෙනෙවිරත්න මහත්මිය
905 - C.I. ප්‍රනාන්දු මිය
211 - S. ජයසිංහ මහත්මිය
3301 - D.M. රත්නසිරි මහතා
1165 - P. දුල්මන් පීරිස් මහතා
3046 - සුමනා ජයතිලක මහත්මිය
3650 - B. ආරියදාස මහතා
405 - K.A.D.J. අප්පුහාමි මහතා
3397 - R. ප්‍රේමදාස මහතා
768 - K.R. ප්‍රනාන්දු මහතා
515 - W. ජයසේන මහතා
709 - J.M. සිල්වා මහතා
3499 - G. සෝමදාස මහතා
3498 - N.P. සුනිල් මහතා

## මරණය නියතයි... ඔබේ මතකය සදාතනිකයි...

**බැංකු පියසේ සුවඳ තැවරූ**
**සොඳුරු මතකය මල්දමක් කොට**
**තබන්නෙමු අද ඔබේ අබියස**

**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය**

## DEATH DONATION (DD) & CONTRIBUTORY DEATH DONATION (CDD) – 2023

| | | | |
|---|---|---|---|
| 606 | - Mr. H.I. Ariyawansa | 25,000 | 75,000 |
| 358 | - Mr. M.B.D. Silva | 25,000 | 75,000 |
| 745 | - Mr. P.N. Balasuriya | 25,000 | 75,000 |
| 414 | - Mr. D.R. Rathnasekara | 25,000 | 75,000 |
| 1189 | - Mrs. S. Sugathadasa | 25,000 | |
| 210 | - Mr. H.B. Emanis | 25,000 | 75,000 |
| 645 | - Mr. M.E.G.R. Fernando | 25,000 | |
| 286 | - Mr. Gamini Atapattu | 25,000 | 75,000 |
| 3057 | - Mr. S. Somarathna | 25,000 | 75,000 |
| 1176 | - Mr. H.M. Premasiri | 25,000 | 75,000 |
| 793 | - Mr. B.T. Jayatilake | 25,000 | |
| 618 | - Mr. A.G.K. Perera | 25,000 | 75,000 |
| 202 | - Mr. P.W. Upasena | 25,000 | |
| 511 | - Mrs. G. Palihakkara | 25,000 | 75,000 |
| 766 | - Mrs. W.R. Seneviratne | 25,000 | |
| 905 | - Miss. C.I. Fernando | 25,000 | |
| 3301 | - Mr. D.M. Rathnasiri | 25,000 | |
| 1165 | - Mr. P. Dulman Peiris | 25,000 | 75,000 |
| 3650 | - Mr. B. Ariyadasa | 25,000 | 75,000 |
| 405 | - Mr. K.A.D.J. Appuhamy | 25,000 | 75,000 |
| 3397 | - Mr. R. Pemadasa | 25,000 | |
| 709 | - Mr. J.M. Silva | 25,000 | 75,000 |
| | **Total** | **550,000** | **1,050,000** |

- සැඳෑව සඟරාවේ පළකිරීම සඳහා එවන ලිපි සංගමයේ ලේකම් වෙත යොමු කරන්න.
- ඔබගේ ලිපි හැකිතරම් සංක්ෂිප්තව සකස් කරන්න.
- සැඳෑව මුද්‍රණය කරගැනීම සඳහා මහ බැංකු මුද්‍රණාලයෙන් සැපයුණු පහසුකම් දැන් නොලැබෙන බැවින් සැඳෑවේ පිටු ගණන සීමා කිරීමට සිදුව ඇති බවද කරුණාවෙන් සලකන්න.

**සංස්කාරක**

සந்தாவ

වෙබ් අඩවිය : www.sendewa.org

අංක : DOP/NEWS/30/2024 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදි.

**ගරු ලේකම්,**
**පී.ඩී. චන්ද්‍රසිරි මහතා**
**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය**
**626/14, ගෝවින්න පාර,**
**සාම පෙදෙස, අතුරුගිරිය.**

Talent Printers - Super Market, Moratuwa
talentprinters@gmail.com